**මාධ්‍ය නිවේදනය**
කොළඹ, 2017 ජුනි 28

Nestlé
Good Food, Good Life

# නෙස්ටමෝල්ට් රන් රථ වාසනා තෙවැනි ජයග්‍රාහකයාට, මෝටර් රථය ප්‍රධානය කෙරේ

*ඉදිරියේදී තවත් මෝටර් රථ දෙකක් දිනාගැනීමට අවස්ථාවක්*

දශක පහකට අධික කාලයක් පුරා ශ්‍රී ලංකාවේ ජනප්‍රියතම මෝල්ට් පානයක් වී ඇති නෙස්ටමෝල්ට් විසින් සංවිධානය කළ 'රන් රථ වාසනා' දිනුම් ඇදීමේ වැඩසටහනේ තෙවැනි මෝටර් රථ ජයග්‍රාහිකාව ලෙස හඟුරන්කෙත, මඩවැල්ල ප්‍රදේශයේ පදිංචි බී. ඩබ්ලිව්. සී. කේ. ජයසේකර මෙනවිය පසුගියදා තේරී පත්වූවා ය. නෙස්ටමෝල්ට් රන් රථ වාසනා දිනුම් ඇදීමට මේ වන විටත් ලක්ෂ දෙකකට වැඩි කූපපත් සංඛ්‍යාවක් ලැබී ඇති අතර ඒ අතුරින් තෝරාගැනෙන පළමු ජයග්‍රාහකයින් පස්දෙනාට නවීනතම Kia Picanto මෝටර් රථය බැගින් ලබා දීමට නියමිතයි.

මෙම ප්‍රවර්ධන වැඩසටහන හරහා තවත් වාසනාවන්ත ජයග්‍රාහකයින් දෙදෙනෙකුට, එම සුපිරි ත්‍යාගය ජයග්‍රහණය කිරීමට තවදුරටත් අවස්ථාවක් ලබා දී ඇත. නෙස්ටමෝල්ට් ග්‍රෑම් *400* පැකට්ටුවක හෝ සුපර් පැක් එකක උඩු පියන්පතක් ගෙන එහි තමාගේ නම සහ ලිපිනය ලියා 'නෙස්ටමෝල්ට් රන් රථ වාසනා, තැපැල් පෙට්ටිය *1720*, කොළඹ' යන ලිපිනයට එවීමෙන්, පාරිභෝගිකයින්ට මෙම දිනුම් ඇදීමේ තරඟයට සහභාගී විය හැක. නෙස්ටමෝල්ට් විසින් සංවිධානය කරන මෙම ප්‍රවර්ධන වැඩසටහනට මුදල් අමාත්‍යාංශයේ පූර්ණ අනුමැතිය ලබා දී ඇත.

"බලය, ජවය හා ශක්තියෙහි පරිපූර්ණ මුසුවක් ඇති නෙස්ටමෝල්ට්, වසර ගණනාවක් තිස්සේ විවිධ ප්‍රවර්ධන වැඩසටහන් හා ක්‍රියාකාරකම් තුළින් ශ්‍රී ලාංකික පාරිභෝගික ජනතාවගේ හදවත් දිනාගෙන තිබෙනවා. රන් රථ වාසනා දිනුම් ඇදීම හරහා, නෙස්ටමෝල්ට් සමඟ දිගින් දිගටම රැඳී සිටි හා මෙම ප්‍රවර්ධන තරඟයට උනන්දුවෙන් එක්වුණු ළබැඳි පාරිභෝගිකයින් වෙත වටිනා තිළිණ පිරිනැමීමට අපට අවස්ථාව ලැබී තිබෙනවා" යනුවෙන් නෝමන් කන්නන්ගර මහතා, නෙස්ලේ උප සභාපති - පාන වර්ග, අදහස් දක්වා සිටියා.

මෙම රන් රථ වාසනා තරඟය දියත් කරනු ලැබුවේ මෙරට පවුල්වලට, සාර්ථකත්වය කරා යාමට මෙන්ම මුළු රටම නෙස්ටමෝල්ට් බලයෙන්, ජවයෙන් හා ශක්තියෙන් බලගැන්වීමට දිරිය ලබා දෙන, නෙස්ටමෝල්ට් 'රන්වන් ශ්‍රී ලංකාවක් ' වැඩසටහනෙන් අනතුරුව ය.

ශ්‍රී ලංකාවේ වඩාත් ප්‍රියතම, ඉකෝනිය මෝල්ට් පානයක් ලෙස ජනප්‍රිය වී ඇති නෙස්ටමෝල්ට්, වසර ගණනාවක් පුරාවට මෙරට බාල තරුණ මහලු සියලු දෙනාගේම පෝෂණ අවශ්‍යතා වෙනුවෙන් දායකත්වය සපයා තිබේ. ශ්‍රී ලංකාවේ පමණක් නිෂ්පාදනය කෙරෙන නෙස්ටමෝල්ට්, ඉදිරියේදීත් බලය, ජවය, ශක්තිය සමඟින් රන්වන් මෝල්ට් සහ කිරි ගුණයෙන් පරිපූර්ණව, දසත පැතිරුනු පාරිභෝගිකයන්ගේ ජීවිත උසස් කරලීමට කටයුතු කරනු ඇත.